# 2 නිවාසාන්තර ක්‍රීඩා උත්සවය



**නිවේදක** : "වයස අවුරුදු පහළොවෙන් පහළ මීටර් සියය දිවීමේ තරගය සඳහා ඉදිරිපත් වන සිසුන් වහා ම තරගය ආරම්භක ස්ථානයට වාර්තා කරන්න."

*අරලිය නිවාසයේ ක්‍රීඩා නායක* **ජගත්** : "කෝ මේ අරුණ? මෙහාට එන්න. ඉක්මනට තරගය ආරම්භ කරන තැනට යන්න."

**අරුණ** : "හා හොඳයි."

**නිවේදක** : "දැන් පිටියේ දර්ශනය වන්නේ පහළොවෙන් පහළ මීටර් සියය දිවීමේ තරගයයි. තරගකරුවන් ජය කණුව කරා වේගයෙන් දිව යනවා. නිවාසවල සිසුන් ඉතා ඕනෑකමින් ඔවුන් දිරිමත් කරන ආකාරය අපට පේනවා. වයස අවුරුදු දාහතෙන් පහළ මීටර් සියය හතර සහාය දිවීම සඳහා ඉදිරිපත් වන සිසුන් සූදානමින් සිටින්න."

*සමන් නිවාසයේ*
***ක්‍රීඩා නායක වසන්ත*** : "අන්න, දාහතෙන් පහළ මීටර් සියය හතර සහාය දිවීම ඊළඟට තියෙනවා ලු. කෝ අපේ නිවාසයෙන් ඒකට ඉදිරිපත් වන හතරදෙනා? නම් ලැයිස්තුව බලන්න."

*සමන් නිවාසයේ*
***ක්‍රීඩා උපනායක මලිත්*** : "මෙන්න ලැයිස්තුව. අසංක, රුසිරු, යසස්, නිශාන්ත."

*සමන් නිවාසයේ*
***ක්‍රීඩා නායක වසන්ත*** : "එන්න, ඒ හතරදෙනා ඉදිරියෙන් ඉන්න. දැන් කතා කරයි. එතකොට යන්න."

*රුසිරු* : "කෝ මේ අසංක? එයා එක්කගෙන එන්න."

***නිවේදක*** : "ඊළඟට තියෙන්නේ උස පැනීමේ තරග. වයස අවුරුදු එකොළහෙන් පහළ, දහතුනෙන් පහළ, පහළොවෙන් පහළ, දාහතෙන් පහළ තරගවලට ඉදිරිපත් වන සියලු ම සිසුන් වහා ම ආරම්භක ස්ථානයට වාර්තා කරන්න."

*රෝස නිවාසයේ*
***ක්‍රීඩා නායක කුමාර*** : "කෝ අපේ නිවාසයෙන් උස පැනීමේ තරගයට ඉදිරිපත් වෙලා ඉන්න අය මෙහෙට එන්න. අංජන, සුසන්ත, ඉඳුනිල්, රුවන්ත. හරි, හතර දෙනා ම ඉන්නවා. මං කියන දේ හොඳට අහගන්න.
කලබල වෙන්න එපා. තමන්ගෙ වාරය එනතුරු ඉවසීමෙන් ඉන්න."

## ක්‍රියාකාරකම : 1

1. පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට බෙදී ගුරුවරයාගේ සහාය ඇති ව පාඩමේ දැක්වෙන අවස්ථාව නිරූපණය කරන්න.
2. නිවේදක විසින් ඉදිරිපත් කරනු ලැබූ නිවේදනවල ඇතුළත් වූ මූලික කරුණු මොනවා ද?
3. එක් එක් නිවේදනයට සවන් දුන් නිවාස නායකයින් ඒවාට ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද?

## ක්‍රියාකාරකම : 2

වචන නිසි ලෙස ගළපා විධාන හා නිවේදන සකස් කරන්න.

i. එල්ලන්න, බෑග්, තම තමන්ගේ, රාක්කයේ

ii. කාලසටහන, කරන්න, පන්තිය, අනුගමනය, පිරිසිදු කිරීමේ

iii. උපකරණ, පිරිසිදු කිරීමේ, තැන, තබන්න, නියමිත

iv. හුණු පුවරුව, අවසානයේ දී, පාඩම, කරන්න, පිරිසිදු

v. එල්ලා, හුණු කොට්ටය, තබන්න, ඇණයේ

vi. ඉදිරියට, පන්දුව, ඇදී එනවා, වේගයෙන්

vii. එල්ල කළා, දක්ෂ ලෙස, ඔහු, හයේ පාරක්

viii. උත්සවයට, පැමිණෙන්න, නොවරදවා, දහම් පාසලේ, සිසුන්, සියලු ම

## ක්‍රියාකාරකම : 3

පහත සඳහන් වචන යොදා ගෙන විධාන හා නිවේදන කිහිපයක් සකසන්න.

| | |
|---|---|
| සූදානම් වන්න | පනින්න එපා |
| ආධාර කරන්න | ලියන්න |
| පිරිසිදු කරන්න | දුවන්න |
| සිනාසෙන්න | නටන්න |

## ක්‍රියාකාරකම : 4

පහත දක්වෙන කවි පෙළෙහි ඇතුළත් වන විධාන හා පණිවිඩ මොනවා ද?

1. කුරුල්ලනේ ගී ගයන්න
   අහස පුරා සැරි සරන්න
   ඔබත් එක්ක පියාඹන්න
   පියාපතක් මටත් දෙන්න

2. සමනලයිනි හනික එන්න
මල් පැණිවල රස බලන්න
ඔබත් එක්ක මලට යන්න
පියාපතක් මටත් දෙන්න

3. වදයේ පැණි පුරවගන්න
මී මැස්සනි පැණි සොයන්න
ඔබත් එක්ක එකතු වෙන්න
පියාපතක් මටත් දෙන්න

4. අන්සතු ලේ උරා බොන්න
දරුණු රෝග පතුරු වන්න
මදුරුවන්ට ඉගිළ යන්න
පියාපතක් එපා දෙන්න

5. ජීවය අවසන් කරන්න
මෙරුවන්හට ඉඩ ලැබෙන්න
පහන ළඟට පියාඹන්න
පියාපතක් එපා දෙන්න

## ක්‍රියාකාරකම : 5

පහත 'අ' 'ආ' කොටස්වල දක්වා ඇති වාක්‍ය කියවන්න. එම වාක්‍ය අතර ඇති වෙනස හඳුනා ගන්න.

**'අ'**

**නිවේදක :** මීටර් සියය දිවීමේ තරගය සඳහා ඉදිරිපත් වන වයස අවුරුදු පහළොවෙන් පහළ සිසුන් වහා ම තරගය ආරම්භ කරන තැනට වාර්තා කරන්න.

**'ආ'**

**නිවේදක :** දැන් පිටියේ දර්ශනය වන්නේ පහළොවෙන් පහළ මීටර් සියය දිවීමේ තරගයයි. තරගකරුවන් ජය කණුව කරා වේගයෙන් දිව යනවා. නිවාසවල සිසුන් ඉතා ඕනෑකමින් ඔවුන් දිරිමත් කරන ආකාරය අපට පේනවා.

## ක්‍රියාකාරකම : 6

ක්‍රීඩාවක් හෝ උත්සවයක් පිළිබඳ ව හෝ විධාන හා නිවේදන ඇතුළත් විස්තර ප්‍රචාරයක් හෝ පන්තියට ඉදිරිපත් කරන්න.